අභ්‍යන්තර විභාග නිවේදනයයි.

PPSC/EX/4/1/16/2022
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2022.10.26

## <u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (II) (2023)</u>

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2023 පෙබරවාරි මස** කොළඹදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

(ii) මෙම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

03. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු අතර, ඒ අනුව වයඹ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් **2022 නොවැම්බර් 21 දින** නොඉක්මවා **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට තම අයැදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහල කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයැදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව**:-**
විභාග ශාලාවේදී තමා පෙනී සිටින එක් එක් විෂය සඳහා විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි තම අනන්‍යතාව අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම් පත්‍රය.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුලත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

05. **අයදුම්පත්‍රය:-**

(i) “ඒ 4” ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 07 තෙක් පළමු පිටුවටද ඉතිරිය අනෙක් පිටුවටද ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතුය. අපේක්ෂක/අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතුය.

(ii) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුයි. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

06. විභාග ගාස්තු:-

පළමුවරට මෙම සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයකට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාර වලදී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් සම්පූර්ණ විභාගය සඳහා රු: 500/-ක්ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු:250/- ක්ද වයඹ පළාත් සභාවේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලද ව.ප.ස.මු.02 කුවිතාන්සියක් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා ඉදිරිපත් කළ යුතුය. මෙම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මොනම කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමටද ඉඩදෙනු නොලැබේ.

07. විභාග ප්‍රවේශපත්‍ර:-

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කල යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පලකරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් ෆැක්ස් මඟින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් ලබාගැනීම සඳහා පහත සඳහන් විස්තර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ලබාගෙන ෆැක්ස් මඟින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත වහාම දැන්විය යුතුය.

(i) විභාගයේ නම:…………………………………………………………......
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම:…………………………………………
(iii) ලිපිනය:……………………………………………………………..
(iv) ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................
(v) ඉල්ලුම්පත්‍රය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් තැපැල් කල දිනය හා ලියාපදිංචි අංකය: …………………………………
(vi) ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකය: …………………………………

විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා හෝ රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධරයකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිව්රුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත්

නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයැදුම්කරුවකු තමාට අදාල එක් මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියළුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කළ නොහැක.**

10. අයැදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියට ඇතුළත්ව සිටින නිලධරයන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

11. ඉහත (06) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

12. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට අදාළ නියමිත කාලය තුළ තම අභිමතය පරිදි, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධරයන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40 % ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

13. විභාග පටිපාටිය:-
II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02න් සමන්විත වේ.

විෂය අංකය (03) - ආයතන සංග්‍රහය
(කාලය පැය 02කි) ලකුණු100යි

විෂය අංකය (04) - මුදල් රෙගුලාසි
(කාලය පැය 02කි) ලකුණු 100යි

<u>**විෂය නිර්දේශය :-**</u>

**ආයතන සංග්‍රහය - (විෂය අංකය - 03)**

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

| | |
|---|---|
| XV වන පරිච්ඡේදය - | අධ්‍යාපන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා පිටරට යෑම |
| XVI වන පරිච්ඡේදය - | නිවාඩු ගමන් |
| XXIII වන පරිච්ඡේදය - | ඇතැම් වර්ග වල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV වන පරිච්ඡේදය - | වැටුප් ණය හා අත්තිකාරම් |
| XXV වන පරිච්ඡේදය - | වෘත්තීය සංගම් වල සාමාජිකයන්ට අනුග්‍රහය |
| XXVII වන පරිච්ඡේදය - | ලිපි ගණුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII වන පරිච්ඡේදය - | පරිපාලන කාර්ය පටිපාටි හා විධි |
| XXX වන පරිච්ඡේදය - | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII වන පරිච්ඡේදය - | නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග |
| XLVII වන පරිච්ඡේදය - | සාමාන්‍ය හැසිරීම හා විනය |
| XLVIII වන පරිච්ඡේදය - | විනය කාර්ය පරිපාටි පිළිබඳ රීති |

**මුදල් රෙගුලාසි - (විෂය අංකය - 04)**

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

(i) VI වැනි පරිච්ඡේදය
ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, උප පත්‍රිකා පොත්, මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම්
(මු.රෙ. 315 සිට 396 දක්වා)

(ii) XIII වැනි පරිච්ඡේදය
සැපයුම්, වැඩ හා සේවා
ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු, සැපයුම්, භාණ්ඩවල භාරය සහ හරි වැරදි බැලීම, වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ.
(මු.රෙ. 685 සිට 775 දක්වා)

14. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම:-
විභාග කොමසාරිස් ජනරාල් වෙතින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ප්‍රතිඵල ලැබුණු පසු ඒ බව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

15. මෙම විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබූ, පළමු වතාවට විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

16. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිලිබඳ වුවද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

17. විභාග අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ටී. බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ,

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (II) (2023)</u>**

**<u>Efficiency Bar Examination Prescribed For Officers In Grade II of Sri Lanka Technological Service of Provincial Council Public Service (NWP) – 2018 (II) 2023</u>**

(එක් නිලධරයෙකුට III ශ්‍රේණිය සහ II ශ්‍රේණිය විභාග දෙක සඳහාම එකවර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැක)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයටද යන වග (ඔබ අයත් රාජ්‍ය සේවයට අදාළ අංකය කොටුව තුළ ලියන්න) **06**

02. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................
(උදා:- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ආ) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................
(උදා :- GUNAWARDHANA H.M.S.K)

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්):...........................................................
...........................................................

03. රාජකාරී ලිපිනය : (මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ)
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ...........................................................
(සිංහලෙන්/දෙමළෙන්) : ...........................................................

04. ස්ත්‍රී / පුරුෂ භාවය
පුරුෂ -0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

07. ඉදිරිපත් වන විෂයය/විෂයයන්

| විෂයය | විෂය අංකය |
|---|---|
| ........................................................ | |
| ........................................................ | |

08. (i) උපන් දිනය :- වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |
(ii) 2022.11.21 දිනට වයස: අවු: | | | මාස: | | | දින: | | |

09. (i) පදවි නාමය:-.......................................................................................

(ii) 2022.11.21 වැනි දිනට II ශ්‍රේණියේ සේවා කාලය: ..............................................

10. ඔබ අයත් වන දෙපාර්තමේන්තුව : ........................................................................

11. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: .....................................................
රිසිට්පත් අංකය :……………………… දිනය:…..........……………
මුදල:……………………

ලදුපත මෙහි අලවන්න. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් හා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට යටත් වන බවද ප්‍රකාශ කරමි.

………………….......................
අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත්සන

දිනය:…………………

## අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ……………….......................…. මහතා/මහත්මිය/මෙනවිය …………………… දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.......……………….......
අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ...............................................
සහතික කරන නිලධාරියාගේ නම :...........................................
තනතුර : .............................................
ලිපිනය : .............................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:

ඉහත අංක 01 සිට 11 තෙක් ජේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

……………………………………………………
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය:………………………………